


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පී (ඔටෝ සර්විස්) 11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධීක්ෂණ නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම සැහැල්ලු වාහන, බරවාහන සහ උපකරණ වල සේවා කටයුතු නිසි පරිදි සිදු කිරීම, දෝෂ තත්වයන් පවතී නම් ඒ පිලිබඳ රියදුරන සහ අධීක්ෂණ නිළධාරීන් දැනුවත් කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 සයළුම වාහන සහ අදාළ උපකරණ වල පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ නිස පරිදි පවත්වා ගෙන යාම.

11 සේවා සථානයේදී රියැදුරන්ගෙන් වාහනය පරීක්ෂා කර භාර ගැනීමෙන් පසු වාහනය ධාවනය කර ඇති කිලෝමීටර් ප්‍රමාණය හෝ කාලය අනුව අවශ්‍ය සේවා කටයුත සිදු කිරීම.

111 මාරු කිරීමට අවශ්‍ය සියළුම ෆල්ටර් අධීක්ෂණ මහතා හට භාර දීම, එයාර් ෆල්ටර් මාරු නොකරන විට ඒවාට හුලං අල්ලා පිරිසිදු කර සවි කිරීම.

1V එන්ජින් ඔයිල්, ගියර් ඔයිල් , ඩිෆරන්ෂිල් ඔයිල් මාරු කිරීමට අවශ්‍ය නම් පමණක් මාරු කිරීම හා ඔයිල් මට්ටම නියමිත පරිදි තැබීමට කටයුතු කිරීම.

V වාහන පරීක්ෂාවේදී හඳුනා ගනු ලබන සියළුම විශේෂිත තත්වයන් එනම් තෙල් හා ජලය කාන්දුවීම්, කැඩීම්, ගෙවීම් හා බුරුල්වීම පිළිබඳ අධීක්ෂණ නිළධාරීන් හා රියැදුරු මහතුන් දැනුවත් කිරීම.

VI එන්ජින් ඔයිල් , ගියර් ඔයිල් , ඩිෆරන්ෂිල් ඔයිල් , රේඩියේටර් වතුර හා බැටරි වතුර යනාදියෙහි මට්ටම් පරීක්ෂා කර බලා අඩු නම් ඒවා පිරවීම.

VII වාහන වලට යෙදිය යුතු ලිහිසිකරණයන් අවශ්‍ය පරිදි යෙදීම.

VIII හැකි සෑම විටම වාහන වල රෝද ගලවා පිරිසිදු කර තිරිංග පද්ධතියට අදාළ කොටස්වල ගෙවීම් හෝ කාන්දු වීම් තිබේ නම් අධීක්ෂණ නිළධාරීන් හා රියැදුරන් දැනුවත් කිරීම.

IX තම සේවා කටයුතු වලට අදාළ දෛනික වාර්ථා හා ගබඩා වාර්ථා සටහන් පොත් නිසි පරිදි පවත්වාගෙන යාම.

X අධීක්ෂණ නිළධාරීන් විසින් කලින් කලට පවරන ලබන අනෙකුත් සේවා සඳහා සහභාගී යාම.

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තිය සහතියක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සයළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2023 **ඔක්තෝබර් මස** 16 **වන දිනට** පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක් ඉදිරිපත් කල යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (ඔටෝ සර්විස්)** II **වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.** පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළසහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**

**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**

Date :04/10/2023